# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2116/30 - 2019 මාර්තු මස 26 වැනි අඟහරුවාදා - 2019.03.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ, 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ඇහැලියගොඩ නව ජල සම්පාදන ව්‍යාපෘතිය යටතේ ජල තුළුමුව ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උප ලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය,

2019 මාර්තු මස 13 වැනි දින,
අංක 35,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1456

*උපලේඛනය*

කෑගල්ල දිස්ත්‍රික්කයේ, දෙහිඕවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 124C ගලබලන කන්ද ග්‍රාම නිළධාරී වසමේ මානියංගම ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු එම්. ඩී. ඒ. ජයලත් කුමාර විසින් සකස් කරන ලද සැලසුම් අංක 985 හි කැබලි අංක 02 ලෙස දැක්වෙන නාගහහේන නැමති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 60ක් පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස..

1A - G 29741 - 39 (2019/03)
*මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උතුරට* : සීතාවක ගඟ;
*නැගෙනහිරට* : සීතාවක ගඟ;
*දකුණට* : එම සැලැස්මේ කැබලි අංක 04;
*බටහිරට* : එම සැලැස්මේ කැබලි අංක 01.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 1. ගලබලන්නලාගේ විමලසේන මයා ,
568/4,
පහල මානියංගම,
අවිස්සාවේල්ල.

04-303

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට රුවන්වැල්ල ජල යෝජනා ක්‍රමයේ ජල ගබඩා ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක අයිතිය අත්කර ගැනීමට අවශ්‍යව ඇති හෙයින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපළ අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍ය,

2019 මාර්තු මස 13 වැනි දින,
අංක 35, ලක්දිය මැඳුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,
බත්තරමුල්ල,
නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.
5/2/2/1457

**උපලේඛනය**

කෑගල්ල දිස්ත්‍රික්කයේ රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 103ඒ, මොරලිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ දෙවෙක්කන්ද ගමේ පිහිටි - රුවන්වැල්ලවත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 40 ක් පමණ වන පහත සඳහන් මායිම් තුල වූ ඉඩම් කොටස..

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස හා රුවන්වැල්ල වත්ත;
*නැගෙනහිරට* : වතු පාර හා මෙම ඉඩමේ ඉතිරි කොටස;
*දකුණට* : එම ඉඩමේ ඉතිරි කොටස;
*බටහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. ප්‍රධාන විධායක නිලධාරී,
මල්වත්ත වැවිලි සමාගම,
අංක 280,
ඩැම් වීදිය, කොළඹ 12.

04-304

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.